**1990 සුවසැරිය පදනම - 2023**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

1990 සුවසැරිය පදනමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සුවසැරිය පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සුවසැරිය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සුවසැරිය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සුවසැරිය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සුවසැරිය පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සුවසැරිය පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සුවසැරිය පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සුවසැරිය පදනම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.5.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකාධිපතිගේ නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26 (ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2023 ජනවාරි 01 දින වන විට පැවති රු. 330,091,526 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ද භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | මෙම මුදල ලබා ගැනීමට පසුගිය වසර කීපයේම සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් භාණ්ඩාගාරය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය සියළු ලිපිගොනු හා ලිපි ලේඛන භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත. නමුත් මේ සඳහා භාණ්ඩාගාරය කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නැති අතර එක් අවස්ථාවකදී පමණක් සාකච්ඡාවකට පැමිණෙන ලෙස වාචිකව දන්වා එම සාකච්ඡාවද පසුව අවලංගු කරන ලදී. එම කරුණ හැර වෙනත් කිසිඳු ප්‍රතිචාරයක් භාණ්ඩාගාරයෙන් දක්වා නොමැති බව පෙන්වා දෙමි. | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මෙම මුදල සම්බන්ධයෙන් නිශ්චිත තීරණයක් ගෙන ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකාධිපතිගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනත | | | |
| | (i) පනතේ 12 (1) වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්, යටත් පිරිසෙයින් මසකට එක් වතාවක් පවත්වනු ලැබිය යුතු වුවත් පදනම විසින් සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ | වර්ථමාන අධ්‍යක්ෂක මණ්ඩලයේ නොසැලෙන කැපවීම නිසා අභියෝග රැසක් මධ්‍යයේ 1990 සුව සැරිය | පනතේ විධිවිධාන අනුව කටයුතු නොකිරීමට හේතු සොයාබැලිය යුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | මණ්ඩල රැස්වීම් 06 ක් පමණක් පවත්වා තිබුණි. | පදනම බාධාවකින් තොරව කටයුතු කරගෙන යන බව දන්වමි. | අතර, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | පනතේ 18 (5) සහ 25 (1) වගන්ති | මණ්ඩලය විසින් අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් සහ රීති සැදිය හැකි ප්‍රධාන කරුණු 05 කින් කිසිදු කරුණක් සම්බන්ධයෙන් රීති සකස් කර නොතිබුණි. | පනතේ 18(5) වගන්තියෙන් දැක්වෙනුයේ අරමුදලෙන් මුදල් ගෙවීම සම්බන්ධ රීති සකස් කල යුතු බව" මේ අනුව දැනටමත් මූල්‍ය රීති සකස් කර ඇති අතර එය වැඩිදුරටත් අධ්‍යයනය කරමි.එ ම මූල්‍ය රීති පිළිබඳව ඉක්මනින්ම රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර් ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව. | පනත යටතේ රීති සැදීමට බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් රීති සකස් කිරීමේ ප්‍රමාදයන්ට හේතු සොයා බලා කඩිනමින් රීති සකස් කර අනුමත කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත | | | |
| (i) | මෙහෙයුම් අත්පොතෙහි 7.5 ඡේදය | උක්ත අත්පොතෙහි 7.4 ඡේදය ප්‍රකාර වාර්තාවන් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්විම් වලදී පරීක්ෂා කළයුතු අතර ඒ පිළිබඳව මාසික, කාර්තුමය සහ වාර්ෂික කාර්යසාධන වාර්තා අවශ්‍ය පරිදි අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතු වුවද පදනම විසින් එසේ සිදුකර නොතිබුණි. | සියළුම කරුණු සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදීම සාකච්ඡාවට සහ සමාලෝචනයට භාජනය කර ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගත යුතු ඉදිරි පියවර ද ගෙන ඇති බව, කෙසේ වුවද ඒවා මාසිකව හා කාර්තුමය වශයෙන් නොයැවුවද වරින් වර අමාත්‍යාංශයට හා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇති බව. | මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීමට හේතු සොයා බැලිය යුතු අතර, මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී සිදු නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | මෙහෙයුම් අත්පොතෙහි 6.7 ඡේදය | ස්ථාවර වත්කම් හා ගබඩා පිළිබඳව වාර්ෂිකව වත්කම් සත්‍යාපනයක් සිදු කළ යුතු වුව ද පදනමෙහි පවතින ස්ථාවර වත්කම් අයිතම 07 න් 05 ක් සඳහාම එසේ වත්කම් සත්‍යාපනයක් | පදනමේ පවතින කාර්ය මණ්ඩල හිඟ තත්ත්වය නිසා ගිලන් රථවල පවතින වත්කම් සෑම වසරකම සත්‍යාපනය නොකළද, 2023 වර්ෂයේදී | මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීමට හේතු සොයා බලා ඊට |

| | | |
|---|---|---|
| සිදු කර නොතිබුණි. | බස්නාහිර පළාතේ පැවති සියළු ගිලන් රථවල සියළු වත්කම් සත්‍යාපනය කර ඇති බව, එලෙසටම අනෙකුත් පළාත් වලද වත්කම් සත්‍යාපනය කිරීමට බලාපොරොත්තු වන බව. | අදාලව කටයුතු කිරීමටත් මෙවැනි තත්ත්වයක් ඉදිරියේදී නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 269,930,094 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 293,067,249 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 23,137,155 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පදනමේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි හුවමාරු අගය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණද ඊට ප්‍රතිවිරුද්ධව පදනමට ලැබුණු පරිත්‍යාග වර්ධනය වී තිබුණු බැවින් සමස්ථ පිරිහීමේ අගය අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකාධිපතිගේ නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 18 දරන සුවසැරිය පදනම පනතේ 4 (ඈ) වගන්ති ප්‍රකාරව තෑගි හෝ පරිත්‍යාග ලබාගැනීම සඳහා පදනමට බලතල හිමිව තිබුණි. භාණ්ඩාගාර ලේකම්ගේ අංක FP/01/01/05/09-2022 හා 2022 මාර්තු 30 දිනැතිව පදනමේ සභාපති අමතා එවන ලද ලිපිය ප්‍රකාරව , පදනම වෙත ලැබෙන ත්‍යාග/ප්‍රධාන ගිණුම්ගත කළ යුතු ආකාරය පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති අංක SA/MAA/GRG/01 හා 2022 ජුලි 08 දිනැති මාර්ගෝපදේශය ප්‍රකාරව පදනමට ලබාදෙන පරිත්‍යාග ප්‍රථමයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල ගිණුමට මාරුවනු පිණිස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර පසුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා | ඇතැම් පරිත්‍යාගශීලීන් සතුව රටේ තත්ත්වය සහ එවකට රජයේ මූල්‍ය අංශය කෙරෙහි එතරම් විශ්වාසයක් නොතිබුණු බව, මේ හේතුව නිසා ඔවුන් මහා භාණ්ඩාගරය වෙත ඍජුවම මුදල් එවීම ප්‍රතික්ෂේප කරන ලද බව, මේ හේතුව නිසා ඔවුන් තම චෙක් පත් ඍජුවම පදනම නමට ලියා ඇති බව, සුළු පරිත්‍යාග මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පදනමට ලැබී ඇති බව, එම නිසා ඒවා ඍජුවම අරමුදලට ලබා ගෙන බැංකු ගතකළ අතර නිසි පරිදි ගිණුම් තබා ඇති බව, දැනට සකසා ඇති මූල්‍ය රීතිවල මෙම පරිත්‍යාග ගිණුම් තැබීමේ විධිවිධාන ඇතුළත් කර ඇති අතර එම මූල්‍ය රීති වලට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේදී මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීමට බලාපොරොත්තු වන බව. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු නොකිරීමට හේතු සොයා බලා ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී සිදු නොවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| ගැනීමෙන් අනතුරුව නියමිත අක්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කළ යුතු වුවත් 2023 වර්ෂය තුළ ලැබුණු ආධාර මුදල් රු. 38,198,485 ක් උක්ත මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | | |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකාධිපතිගේ නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වූ අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1189 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩල ඌනතාවය 803 ක් වූ බවත් ඒ අතරින් 363 දෙනෙකු ගිලන් රථ රියදුරන් විය. | 2021 වර්ෂයේ සිට බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාරය අනුමැතිය නොදීමත්, බඳවා ගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට රට තුළ නිසි වාතාවරණයක් නොපැවතීමත් මත මෙම බඳවා ගැනීම සිදු නොවුනද අවසාන වශයෙන් 2023.10.04 වන දින කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ලිපියක් මඟින් හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් 283 ක් සහ ගිලන් රථ නියාමකවරුන් 174 දෙනෙක් පමණක් බඳවා ගැනීමට අවසාන අනුමැතිය ලැබී ඇති බව, ඉන් පසුව මෙම සම්මුඛ පරීක්ෂණ කටයුතු කරමින් දැනට අදාළ බඳවා ගැනීම් සිදු කරමින් පවතින බව. | අත්‍යවශ්‍ය සේවකයින් බඳවා ගැනීමටත්, අත්‍යවශ්‍ය නොවන තනතුරු යටපත් කර අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) සුවසැරිය පදනමේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප් ව්‍යුහය 2019 අගෝස්තු 01 දින සිට අනුමත කර තිබූ නමුත් වාර්ෂික වැටුප් වර්ධක ව්‍යුහයක් අනුමත කර නොතිබුණි. | සේවක මණ්ඩලය ඉවත්ව යාම සිදුවන බව, ඔවුන් සඳහා වැටුප් වැඩිවීමක් හෝ වැටුප් වර්ධකයක් මෙතෙක් භාණ්ඩාගාරය විසින් අනුමත කර නැති බව, සෑම නිළධාරියෙකුටම කාලයක් තිස්සේ ලැබෙනුයේ එකම වැටුප් ප්‍රමාණයක් බව, කිසිදු රාජ්‍ය ආයතනයක එසේ නොවන අතර මේ නිසා බඳවා ගන්නා සේවක මණ්ඩලය කෙටි කලකින් ඉවත් වන බව, මේ සඳහා අවස්ථා කීපයකදීම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළද තවමත් ඒ සඳහා නිසි ප්‍රතිචාරයක් | කාර්යමණ්ඩය රඳවා ගැනීම සඳහා සුදුසු වැටුප් වර්ධක ව්‍යුහයක් අනුමත කරවාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලැබී නොමැති බව, මේ නිසා වර්ථමානයේද බඳවා ගැනීමට සුදුසු නිළධාරීන් පැමිණියද බඳවා ගන්නා නිළධාරීන් ඉන් ඉවත්වීම සහ විදේශ ගත වීමද සිදුවන බව. | |
| (ඇ) | ඉහල කළමනාකරණ තනතුරක් වූ මූල්‍ය ප්‍රධානි (Head of Finance) තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා සම්මුඛ පරික්ෂණයක් පවත්වා තිබුණි. එම සම්මුඛ පරික්ෂණ මණ්ඩලයේ නිර්දේශයන් මත අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ මූල්‍ය උපදේශකයෙකු ලෙස නිලධාරියෙකු මාස 06 ක කාලයක් සඳහා 2021 සැප්තැම්බර් 02 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. පත්කිරීම් කොන්දේසි ප්‍රකාරව තවත් මාස 06 කට පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ හැකි වුවද 2024 අප්‍රේල් 19 දින දක්වා මොහුගේ කොන්ත්‍රාත් කාලය තවත් මාස 25 කින් දිර්ඝ කර තිබුණි. නමුත් මොහුගේ ප්‍රධාන රාජකාරියක් ලෙස සැලකෙන පදනමට අනන්‍ය වූ මුදල් රෙගුලාසි සංග්‍රහයක් සැකසීමේ කටයුතු විගණිත දිනය වන විටත් සිදුකර නොතිබුණි. එබැවින් අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව මූල්‍ය උපදේශක තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමත්, ගිවිසුම් ප්‍රකාරව ඔහුගේ සේවය අවසන් නොකිරීමත් වසර තුනකට වඩා කාලයක් පුරප්පාඩුවී තිබුණු මූල්‍ය ප්‍රධානී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කර ගැනීමට 2024 මාර්තු 15 දින වන විටත් කටයුතු නොකිරිමත් ගැටළුකාරි විය. | අදාළ මුදල් උපදේශක තනතුරට බඳවා ගැනීමට සිදු වූයේ එම අවස්ථාවේදී ප්‍රධාන මූල්‍ය නිළධාරී තනතුරට සඳහා සුදුසුකම් ලත් පුද්ගලයෙක් බඳවා ගැනීමට නොහැකි වීම මත බව, 2023 වර්ෂයේ එවකට සිටි මූල්‍ය කළමනාකරණ නිළධාරියා ඉවත්වී යාම හේතු කරගෙන මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වූ බව, මූල්‍ය උපදේශක තනතුර සඳහා බඳවාගත් නිලධාරියාගේ කොන්ත්‍රාත් කාලය 2024 වර්ෂයේ අප්‍රේල් මාසයේදී අවසන් වීමට නියමිත අතර 2022 හා 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා මඟින් දක්වන ලද නිරීක්ෂන පදනම් කරගනිමින් එකී නිළධාරියා විසින් තම සේවාව අවසන් කිරීම සඳහා පදනමෙන් ඉල්ලා ඇති බව, නමුත් එම නිළධාරියා එම තනතුරෙන් ඉවත් වුවහොත් පදනම සඳහා අවශ්‍ය මූල්‍ය උපදේශන කටයුතු සඳහා පුරප්පාඩුවක් ඇති වන අතර එය පදනමට විශාල පාඩුවක් වනු ඇති බව, මුදල් රෙගුලාසි සංග්‍රහයේ කටයුතු නිම කර නොමැති බව පැවසීම පිළිගත නොහැකි බව, නිළධාරියා විසින් එකී කටයුතු නියමිත දින වන විට අවසන් කර පදනමට භාර දී ඇති අතර එහි ඉදිරි කටයුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත සිදු කළ යුතු බව, | සියළුම පත් කිරීම් විධිමත් අනුමැතීන් යටතේ පමණක් කිරීමට වගබලා ගත යුතුය. |